FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

## 2022 සැප්තැම්බර්

2 වන වෙළුම - කලාප අංක 9


මඩකලපුව මාධ්‍ය සමාජයේ ලේකම් සෙල්වකුමාර් කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකකයට කැඳවා ප්‍රශ්න කිරීම


අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ධනුෂ්ක ලක්මාල් අත්අඩංගුවට ගැනීම


ගුරු වෘත්තීය සමිති ක්‍රියාකාරිනියක වන රේණුකා මලියගොඩගෙන් ප්‍රශ්න කිරීම

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 15ක් 2022 සැප්තැම්බර් මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 05ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 08ක් සහ වෘත්තීයවේදීත්වයට අදාළ සිදුවීම් 02ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. මඩකලපුව මාධ්‍ය සමාජයේ ලේකම් සෙල්වකුමාර් නිලන්තන් කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකකයට (TID) කැඳවා ප්‍රශ්න කිරීම.
2. අන්තර් උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍ය බලමණ්ඩලයේ (HND) හිටපු කැඳවුම්කරු හරිත දර්ශන බන්ධනාගාරගත කිරීම.
3. මඩකලපුව දිස්ත්‍රික් දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති වාලසිංහම් ක්‍රිෂ්ණකුමාර් TID වෙත කැඳවා ප්‍රශ්න කිරීම.
4. අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ධනුෂ්ක ලක්මාල් අත්අඩංගුවට ගැනීම
5. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිනියක වූ රංගන ශිල්පිනී දමිතා අබේරත්න අත්අඩංගුවට ගැනීම.
6. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ගයාන් මදුරංග ත්‍රස්ත විමර්ශන ඒකකයට (TID) කැඳවා ප්‍රශ්න කිරීම.
7. විද්‍යුත් මාධ්‍ය නියාමනය කිරීම සඳහා නව නීති හඳුන්වාදීමට අමාත්‍ය මණ්ඩල යෝජනාවක් ඉදිරිපත් කිරීම.

8. ‘පුනරුත්ථාපන කාර්යාංශයක්’ පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

9. සමාජවාදී තරුණ සංගමය සංවිධානය කළ විරෝධතා පාගමනකට පොලිසිය පහරදීම සහ 82දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

10. කොළඹ නගරයේ ප්‍රදේශ කිහිපයක් අධි ආරක්ෂිත කලාප ලෙස නම් කරමින් රජය ගැසට් නිවේදනයක් නිකුත් කිරීම හා එය අභියෝගයට ලක් කිරීම.

11. ගුරු වෘත්තීය සමිති ක්‍රියාකාරිනියක වන රේණුකා මලියගොඩගෙන් ප්‍රශ්න කිරීම.

12. උද්ඝෝෂණවලට සහභාගී වීම ගැන බැංකු වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන් 5 දෙනකුගෙන් ප්‍රශ්න කිරීම.

13. මාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතීන් හා ගැටලු පිළිබඳ සමීක්ෂණයක්, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මගින් පැවැත්වීම.

14. රාජ්‍ය සේවකයන්ට සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ සීමා පැනවෙන චක්‍රලේඛයක් නිකුත් කිරීම.

15. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මාර්ගගත සංවාදයක් පැවැත්වීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 සැප්තැම්බර්**

| **ආවරණය කර ඇති සංරචකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 05 |
| නීතිමය කොන්දේසි | 08 |
| වෘත්තීයවේදීත්වය | 02 |
| **එකතුව** | **15** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 05ක් සැප්තැම්බර් මාසයේදී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2022 සැප්තැම්බර්: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 05**

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| මානසික බලපෑම් | 05 |
| **එකතුව** | **05** |

01. **මඩකලපුව මාධ්‍ය සමාජයේ ලේකම් සෙල්වකුමාර් නිලන්තන් කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකකයට (TID) කැඳවා ප්‍රශ්න කිරීම.**

සැප්තැම්බර් 02 වැනිදා නිලන්තන්ගේ නිවසට පැමිණි පොලිසිය, සැප් 14 වැනිදා කොළඹ ඔෂෘ වෙත පැමිණෙන ලෙස දැනුම් දී ඇති අතර පවුලේ සාමාජිකයන් සියලු දෙනාගේ නම් සහ හැඳුනුම්පත් අංක සටහන් කරගෙන ඇත. එල්ටීටීඊ මඩකලපුවේ හිටපු දේශපාලන ප්‍රධානී තයමෝහන් සමඟ සබඳතා පැවැත්වූ බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්න කර තිබේ. නිලන්තන් පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා පොලිසිය විසින් අවස්ථා කිහිපයකදීම ප්‍රශ්න කිරීම්වලට ලක් කර ඇත.

මූලාශ්‍රය: www.tamilguardian.com

02. **මඩකලපුව දිස්ත්‍රික් දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති වාලසිංහම් ක්‍රිෂ්ණකුමාර් TID වෙත කැඳවා ප්‍රශ්න කිරීම.**

සැප්තැම්බර් 07 වැනිදා මාධ්‍යවේදියාගේ නිවසට පැමිණි පොලිසිය සැප් 14 වැනිදා කොළඹ ඔෂෘ වෙත පැමිණෙන ලෙස දැනුම් දී ඇති අතර 14 වැනිදා ඔහු ඔෂෘ හි පෙනී සිටියේය. එහිදී සිදු කළ ප්‍රශ්න කිරීම් සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අනාවරණය නොවීය.

මූලාශ්‍රය: www.tamilguardian.com

03. **ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ගයාන් මදුරංග ත්‍රස්ත විමර්ශන ඒකකයට (TID) කැඳවා ප්‍රශ්න කිරීම.**

සැප්තැම්බර් 21දා ඔහු කිරුළපන ත්‍රස්ත විමර්ශන ඒකකය වෙත කැඳවා අරගලයට සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රශ්න කෙරුණු අතර සැප්තැම්බර් 30 වැනිදා නැවත අපරාධ විමර්ශන ඒකකයට (CID) පැමිණෙන ලෙස දැනුම් දී තිබිණි. එදින සහභාගී වීමට නොහැකි බව වාර්තා කළ විට ඔක් 03 වැනිදා පැමිණෙන ලෙස දැනුම් දී ඇත.

මූලාශ්‍රය: www.facebook.com

04. **ගුරු වෘත්තීය සමිති ක්‍රියාකාරිනියක වන රේණුකා මලියගොඩගෙන් ප්‍රශ්න කිරීම.**

ප්‍රකාශයක් ලබාගැනීම සඳහා සැප්තැම්බර් 24 වැනිදා කොළඹ අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත පැමිණෙන ලෙස ඇයට දැනුම් දී තිබිණි. මෙහිදී ඇයගෙන් ප්‍රශ්න කර ඇත්තේ ජූලි 9 වැනිදා සිදු වූ මහජන නැගිටීමට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙනි. මහනුවර සිට දුම්රියක් පැහැරගෙන කොළඹ පැමිණීම සම්බන්ධයෙන් තමාගෙන් ප්‍රශ්න කළ බවත්, එය පැහැරගෙන ඒමක් නොව මුදල් ගෙවා දුම්රිය ප්‍රවේශපත්‍ර ලබාගෙන නීත්‍යානුකූලව පැමිණි ගමනක් බවත් ඇය ප්‍රකාශ කරයි.

මූලාශ්‍රය: twitter.com/JDSLanka

05. **උද්ඝෝෂණවලට සහභාගී වීම ගැන බැංකු වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන් 5 දෙනකුගෙන් ප්‍රශ්න කිරීම.**

මෑත ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ ව්‍යාපාරයට සම්බන්ධවූවන් පිළිබඳ විමර්ශනයන් සඳහා ලංකා බැංකු සේවක සංගමයට අනුබද්ධ ජාතික ඉතිරිකිරීම් බැංකු ශාඛාවේ සාමාජිකයන් 5 දෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ප්‍රශ්න කර තිබේ. වන මාලක ලියනගේ, රයන් වික්‍රමතුංග සහ ෂෙහාන් කාරියප්පෙරුම යන අය සැප් 26 වැනිදාත් ඔෂාන් බුද්ධික සහ දමිත් සාරංග, සැප් 27 වැනිදාත් එසේ කැඳවා තිබිණි.

මූලාශ්‍ර: twitter.com/JDSLanka
twitter.com/JDSLanka

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 08ක් සැප්තැම්බර් මාසය තුළ නිරීක්ෂණය විය. විරෝධතාවලට සම්බන්ධ ක්‍රියාකාරිකයින් අත්අඩංගුවට ගැනීමේ අවස්ථාවන් මෙන්ම නීති ප්‍රතිසංස්කරණ යෝජනා හා නව නීති පැනවීමේ අවස්ථා කිහිපයක්ද ඒ අතර වෙයි. පොදුවේ අදහස් පළ කිරීමේ නිදහස මෙන්ම විශේෂයෙන් ජනමාධ්‍ය නිදහසද සීමා කිරීම ආණ්ඩුවේ අභිලාෂය වී ඇති බව මෙම අවස්ථාවලින් පිළිබිඹු වේ.**

**3 වගුව: 2022 සැප්තැම්බර්: නීතිමය කොන්දේසි - සිදුවීම් 08**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 04 |
| නව නීති පැනවීම් | 02 |
| නීති ප්‍රතිසංස්කරණ යෝජනා | 02 |
| **එකතුව** | **08** |

01. **අන්තර් උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍ය බලමණ්ඩලයේ (HND) හිටපු කැඳවුම්කරු හරිත දර්ශන බන්ධනාගාරගත කිරීම.**

අධිකරණ නියෝග නොතකා පසුගිය මැයි 21 වනදා උද්ඝෝෂණයකට සහභාගී වීමේ චෝදනාවක් සම්බන්ධයෙන් සැප්තැම්බර් 2වැනිදා ඔහු කොටුව මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කරන ලදුව ඔක්. 16 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි. එහෙත් එවැනි නියෝගයක් ඔහුට ලබා දී නොතිබුණු බව හරිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු පෙන්වා දෙති. 16 වැනිදා ඔහුට ඇප නියම වූ අතර නඩුව ඔක්. 28 දා යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: lankatruth.com

02. අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ධනුෂ්ක ලක්මාල් අත්අඩංගුවට ගැනීම

බිරිඳ සහ දරුවා සමග ගෝල්ෆේස් උද්ඝෝෂණාවල ක්‍රියාකාරීව සිටි පැවති නිට්ටඹුව පදිංචි කංකානම්ගේ ධනුෂ්ක ලක්මාල් සැප්. 03 වැනිදා බෙම්මුල්ල පොලිසිය විසින් අත්අඩංගුවට ගැනුණු අතර ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 05 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. 05 වැනිදා ඔහු ඇප මත නිදහස් කරන ලදි. මැයි 09 වැනිදා අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිවසට පහරදීම සම්බන්ධයෙන් ඔහුට චෝදනා කොට ඇතත්, තමන් එදින ගෝල්ෆේස් අරගලභූමියේ සිටි බවට වීඩියෝ සාක්ෂි ඇතැයි ධනුෂ්ක ප්‍රකාශ කරයි.

මීළඟ නඩු වාරය ඔක්තෝබර් 6 වැනිදාට නියම කෙරුණි.

මූලාශ්‍රය: theleader.lk

03. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිනියක වූ රංගන ශිල්පිනී දමිතා අබේරත්න අත්අඩංගුවට ගැනීම.

පාර්ලිමේන්තු වටරවුම අසල විරෝධතාවක නිරතව සිටියදී සැප්තැම්බර් 7 වැනිදා ඇය අත්අඩංගුවට ගෙන කොටුව පොලිස්ථානයේ රඳවා තැබුණු අතර 8 වැනිදා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැප්. 14 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. පොලිසිය පැවසුවේ, ජනාධිපති ලේකම් කාර්යාලයට අයුතු ලෙස ඇතුළුවීම සහ අයුතු ජනරාශිය යන චෝදනා මත ඇය අත්අඩංගුවට ගත් බවයි. සැප් 12 වැනිදා මෝසමක් මගින් නඩුව කැඳවූ අවස්ථාවේ, රු. ලක්ෂ 5 බැගින් වූ ශරීර ඇප දෙකක් මත ඇය නිදහස් කිරීමට අධිකරණය නියෝග කළේය.

මූලාශ්‍රය: www.newsfirst.lk

04. විද්‍යුත් මාධ්‍ය නියාමනය කිරීම සඳහා නව නීති හඳුන්වාදීමට අමාත්‍ය මණ්ඩල යෝජනාවක් ඉදිරිපත් කිරීම.

රූපවාහිනී, ගුවන්විදුලි හා නව මාධ්‍ය නියාමනය සඳහා විකාශන අධිකාරී පනතක් ගෙන ඒම සඳහා වන මෙම යෝජනාව ජනමාධ්‍ය අමාත්‍ය බන්දුල ගුණවර්ධන විසින් කැබිනට් සැප්තැම්බර් 22 වැනිදා කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂගේ සභාපතිත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කර ඇත. විද්‍යුත් මාධ්‍ය සඳහා ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීමටද එමගින් යෝජනා කර තිබේ.

මූලාශ්‍රය: www.youtube.com

05. 'පුනරුත්ථාපන කාර්යාංශයක්' පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

2022 සැප්තැම්බර් 23 වැනි දින අමාත්‍ය විජේදාස රාජපක්ෂ විසින් ඉදිරිපත් කෙරුණු මෙම කෙටුම්පත සම්බන්ධයෙන් දේශපාලන පක්ෂවල හා සිවිල් සමාජයේ දැඩි විරෝධයක් පළ විය. රජයට එරෙහි අරගලයේ ක්‍රියාකාරීන්, පුනරුත්ථාපනය මුවාවෙන් දීර්ඝ කාලයක් කඳවුරු තුළ රඳවා ගැනීමට අවස්ථාව මින් හිමි වන බව ප්‍රධාන චෝදනාවයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ තවත් පාර්ශ්ව කිහිපයක් විසින් කෙටුම්පත අභියෝග යට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කරන ලදි.

මූලාශ්‍රය: www.cpalanka.org

06. සමාජවාදී තරුණ සංගමය සංවිධානය කළ විරෝධතා පාගමනකට පොලිසිය පහරදීම සහ 82 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

සැප්තැම්බර් 24 වැනිදා අත්අඩංගුවට ගත් පිරිස කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එයින් 79 දෙනෙකු පොලිස් ඇප මත මුදාහරින ලදි. එරංග ගුණසේකර, සමාලි මන්දිරා සහ කොස්වත්තේ මහානාම හිමි මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රු. ලක්ෂ දෙක බැගින් වූ ශරීර ඇප මත මුදාහැරිණි. පොලිස් ප්‍රහාරවලට ලක් වූ උද්ඝෝෂකයන් 7 දෙනෙකු රෝහල්ගත කෙරිණි. පොලිසියේ ක්‍රියාකලාපය නීති විරෝධී බවත්, අත්අඩංගුවට ගත් සියලු උද්ඝෝෂකයින් වෙනුවෙන් මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කරන බවත් නීතිඥ සුනිල් වටගල ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: www.youtube.com

07. කොළඹ නගරයේ ප්‍රදේශ කිහිපයක් අධි ආරක්ෂිත කලාප ලෙස නම් කරමින් රජය ගැසට් නිවේදනයක් නිකුත් කිරීම හා එය අභියෝගයට ලක් කිරීම.

රාජ්‍ය රහස් පනතේ දෙවන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සැප්තැම්බර් 23 වැනිදා නිකුත් කළ, අංක 2298/53 දරන මෙම අති විශේෂ ගැසට් නිවේදනය මගින් නම් කර ඇති ප්‍රදේශවල, පොලිස්පතිවරයාගේ හෝ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව පෙළපාළි හෝ සිද්ධ රැස්වීම් පැවැත්වීම තහනම් කොට ඇත.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු සංවිධාන ගණනාවක් ඊට විරෝධය පළ කළේය. රාජ්‍ය රහස් පනත අනුව එවැනි අධිආරක්ෂක කලාප නම් කළ නොහැකි බවත්, මෙය පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්

බවත් අවධාරණය කරමින් මෙම ගැසට් නිවේදනය ඉවත් කර ගත යුතු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය.

මූලාශ්‍ර: www.newsfirst.lk

www.newsfirst.lk

08. **රාජ්‍ය සේවකයන්ට සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ සීමා පැනවෙන චක්‍රලේඛයක් නිකුත් කිරීම.**

රාජ්‍ය පරිපාලන, ස්වදේශකටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් එම්.එම්.පී.කේ. මායාදුන්නේ විසින් සැප්තැම්බර් 27 වැනිදා නිකුත් කරන ලද මෙම චක්‍රලේඛය මගින් සමාජමාධ්‍ය භාවිතය පිළිබඳ සීමා පනවා තිබේ. ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදය 6 වන හා 7 වන වගන්තියෙන් දැක්වෙන විධි විධාන අනුගමනය නොකර රජයේ නිලධරයකු විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් දැක්වීම විනයානුකූලව කටයුතු කිරීමට හේතු වන වරදක් බව චක්‍රලේඛයේ දැක්වේ. මේ සම්බන්ධයෙන් වෘත්තීය සමිති දැඩි ලෙස විරෝධය පළ කරයි.

මූලාශ්‍රය: www.bbc.com

## වෘත්තීයවේදීත්වය

**වෘත්තීයවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම යන දර්ශක ඇතුළත් වේ. මෙම සංරචකය යටතට ගැනෙන සිදුවීම් 02ක් සැප්තැම්බර් මාසයේදී නිරීක්ෂණය විය.**

**5 වගුව: 2022 සැප්තැම්බර්: වෘත්තීයවේදීත්වය - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි/වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධිපත්‍යය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම | 02 |
| **එකතුව** | **02** |

01. **මාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතීන් හා ගැටලු පිළිබඳ සමීක්ෂණයක්, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මගින් පැවැත්වීම.**

ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් වෘත්තීයමය වශයෙන් මුහුණ දෙන ගැටලු හා ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳව පුළුල් ප්‍රශ්නමාලාවක් මාධ්‍යවේදීන්ට ඉදිරිපත් කොට, එම දත්ත විශ්ලේෂණය කිරීමෙන් වාර්තාවක් එළිදැක්වීම මෙහි අරමුණයි.

මූලාශ්‍රය: FMM

02. **තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මාර්ගගත සංවාදයක් පැවැත්වීම.**

තොරතුරු සඳහා විශ්ව ප්‍රවේශය සඳහා වූ ජාත්‍යන්තර දිනය (IDUAI) වෙනුවෙන් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය "ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතියේ පස් අවුරුද්ද, 2017 - 2022" මැයෙන් මෙම මාර්ගගත සංවාදය සංවිධානය කළේය. සැප්තැම්බර් 26 වැනිදා සවස 04 සිට 5.30 දක්වා එය පැවැත්විණි.

මූලාශ්‍රය: SLPI

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි-සැප්තැම්බර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි-අගෝස්තු | | 2022 සැප්තැම්බර් |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 50 | | 05 |
| නීතිමය කොන්දේසි | 80 | 21 | 08 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 06 | | - |
| වෘත්තීයවේදීත්වය | 04 | | 02 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 14 | 01 | - |
| **එකතුව** | **154** | **22** | **15** |

[2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-අගෝස්තු මෙතැනින් බලන්න]

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25